**විසල් මහනුවර ජල සම්පාදන ව්‍යාපෘතිය අදියර I , පියවර II - 2016**

---

විසල් මහනුවර ජල සම්පාදන ව්‍යාපෘතියේ අදියර I , පියවර II හි 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය අතර 2007 මාර්තු 28 දින එළඹි අංක එස්එල්-පී 90 දරන ණය ගිවිසුම හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය අතර 2008 සැප්තැම්බර් 03 දින එළඹි අංක එස්එල්-පී 90 දරන අතිරේක ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වර්තමානයේ නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. විසල් මහනුවර සහ තදාසන්න ප්‍රදේශ වල ජල සැපයුම් සේවා වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපෘති පිරිවැය ඇස්තමේන්තුව අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 4,164 කට සමාන ජපන් යෙන් මිලියන 4,664 ක් විය. පසුව, අතිරේක වැඩ හා මිල උච්චාවචනයන් හේතුවෙන් පිරිවැය ඇස්තමේන්තුව රු. මිලියන 7,146 කට සමාන ජපන් යෙන් මිලියන 5,497 ක් දක්වා සංශෝධනය කර තිබුණි. ඉන් රු.මිලියන 6,024 කට සමාන ජපන් යෙන් මිලියන 4,634 ක් සැපයීමට ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය විසින් එකඟ වී තිබුණි. ඉතිරි මුදල එකතුව රු.මිලියන 1,122 කට සමාන ජපන් යෙන් මිලියන 863 සැපයීමට ශ්‍රී ලංකා රජය එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2007 මාර්තු 30 දින ආරම්භ කළ අතර 2012 සැප්තැම්බර් 30 වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. පසුව, ව්‍යාපෘති කාලපරිච්ඡේදය 2017 ජූනි 20 දක්වා දෙවරක් දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී.ආචාර ධර්ම වල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය

විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසනීයභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි ද යන බව,

(ඌ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඒ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

---------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

## 2.1 මතය

---------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී ඇති බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------

### 2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

----------------------------

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ 2007 අගෝස්තු 07 දිනැති අංක එම්ඕඑෆ්පී/ඊආර්ඩී/2007/2 දරන චක්‍රලේඛයට අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දින හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද, ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2017 අප්‍රේල් 28 දින දීය.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මහනුවර උතුරු ජල සම්පාදන ව්‍යාපෘතිය සහ කුන්ඩසාලේ හරගම ජල සම්පාදන ව්‍යාපෘතිය වැනි වෙනත් ව්‍යාපෘති විසින් අත්කර ගන්නා ලද බිම් කොටස් සඳහා 2016 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු එකතුව රු.මිලියන 5.29 ක් මෙම ව්‍යාපෘතිය යටතේ ගිණුම්ගත කර තිබුණි. ඊට අමතරව,

මහනුවර, පාතදුම්බර ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්කර ගැනීම වෙනුවෙන් 2015 දී දරන ලද එකතුව රු.මිලියන 12.79 ක් මෙම ව්‍යාපෘතිය යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ආ) ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය වෙත මෝටර් වාහනයක් මිලදී ගැනීම සඳහා 2016 මාර්තු 18 දින යවන ලද රු. මිලියන 18.60 ක් කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි. කෙසේ වෙතත්, ප්‍රතිපාදන අපේක්ෂිත අරමුණු සඳහා යොදා ගෙන නොතිබුණු අතර 2017 අප්‍රේල් 25 දින ව්‍යාපෘතිය වෙත නැවත එවා තිබුණි.

**2.2.3 නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම්**

**-------------------------------------------**

ණය ගිවිසුමේ 2 වැනි උපලේඛනයට අනුව, සාමාන්‍ය පරිපාලන වියදම් සහ අනෙකුත් වක්‍ර වියදම් හිමිකම් පෑම සඳහා සුදුසු නොවේ. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළදී සාමාන්‍ය පරිපාලන වියදම් සහ අනෙකුත් වක්‍ර වියදම් රු.මිලියන 37.75 ක මුදලක් කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද බිල්පත්‍ර මඟින් ඉල්ලුම් කර තිබුණු බව නියැදි පරීක්ෂාවේදී අනාවරණය වී තිබුණි.

**2.2.4 ව්‍යාපෘතියේ අරමුණු වලින් පරිබාහිරව අරමුදල් භාවිතය**

**-------------------------------------------------------**

එකතුව රු.මිලියන 9.23 ක ගෙවීම් ව්‍යාපෘතිය මඟින් පියවා තිබුණද එම ක්‍රියාකාරකම් ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා සෘජුවම සම්බන්ධ නොවූ බව නිරීක්ෂණය විය. ඉන් රු.447,880 ක් පොදුකාර්ය වියදම් ලෙස කොන්ත්‍රාත්කරු විසින් අයකර ගෙන තිබුණද, ඒ සඳහා විශේෂිත කාර්යයක් පවරා නොතිබුණි. ඊට අමතර, ව්‍යාපෘතියේ විෂය පථයට අදාළ නොවන ආදායම් නොලබන ජලය සම්බන්ධ නියමු ව්‍යාපෘතියක් සඳහා කෑගල්ල ප්‍රදේශයේ ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලයේ සහකාර සාමාන්‍යාධිකාරී වෙත රු.මිලියන 1.19 ක් ප්‍රේෂණය කර තිබුණි.

**3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

**----------------------------------**

**3.1 අරමුදල් උපයෝජනය**

**----------------------**

ව්‍යාපෘතියේ මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2016 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම. | උපයෝජනය කළ අරමුදල් සමාලෝචිත වර්ෂය තුළ | | 2016 දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|---|---|---|---|---|
| | ජපන් යෙන් මිලියන | රු. මිලියන | රු. මිලියන | ජපන් යෙන් මිලියන | රු. මිලියන | ජපන් යෙන් මිලියන | රු. මිලියන |
| ජ ජා ස නි | 4,634 | 6,024 | නැත | 97.73 | 119.08 | 4,367.50 | 5,754.15 |
| ශ්‍රී ලං ර | 863 | 1,122 | නැත | - | - | 903.56 | 1,108.22 |
| | **5,497** | **7,146** | **නැත** | **97.73** | **119.08** | **5,271.06** | **6,862.37** |

ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් අවසන් කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් ව්‍යාපෘතියේ කාලපරිච්ඡේදය 2017 ජුනි 20 වන විට දෙවතාවක් දීර්ඝ කර තිබුණු බව නිරීක්ෂණය විය. තවද, ඉතිරි ඉදිකිරීම් වැඩ සම්පූර්ණ කිරීමට දැරීමට සිදුවන පිරිවැය 2015 මාර්තු 26 සිට 2015 ජුනි 19 දින දක්වා කාලපරිච්ඡේදය තුළ අරමුදල් එකතුව රු.මිලියන 399.17 ක් ඒ වෙනුවෙන් වෙන්කළ බැංකු ගිණුමට මාරු කිරීමට පියවර ගෙන තිබුණි. එයින් රු.මිලියන 56.60 ක් 2016 දෙසැම්බර් 31 දින වන විට උපයෝජනය වී නොතිබුණි.

### 3.2 භෞතික ප්‍රගතිය

පහත සඳහන් නිරීක්ෂණයන් මේ සම්බන්ධයෙන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතිය මඟින් පිළියෙල කරන ලද ප්‍රගති වාර්තා වලට අනුව, ජල සැපයුම් ටැංකි 08 ක් ඉදිකිරීම, සම්ප්‍රේෂණය / බෙදාහැරීමේ නල පද්ධතිය සැපයීම හා එලීම සඳහා පොම්පාගාර 05 ක් ඉදිකිරීම සහ අනෙකුත් අදාල උපකරණ මිලදී ගැනීම යනාදි ප්‍රධාන කාර්යයන් 2016 දෙසැම්බර් 31 දින වන විට අවසන් කර තිබුණු අතර ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය වෙත භාරදී තිබුණි.

(ආ) ආදායම් නොලබන ජලය සම්බන්ධයෙන් සහ ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය මඟින් සපයන සේවාවල ගුණත්වය, ගෘහස්ථ ජල මීටර් පරික්ෂාව සහ තොග ජල සැපයුම් මීටර් පරික්ෂාව යනාදී පවතින ගැටළු අවම කිරීම සඳහා ප්‍රාදේශීය සැපයුම් මධ්‍යස්ථානයේ පරීක්ෂණාගාර සංකීර්ණයක් ස්ථාපිත කිරීම සඳහා එකතුව රු.මිලියන 166.99 ක් ව්‍යාපෘතිය මඟින් වියදම් කර තිබුණි. එම නිසා ජලයේ සුදුසු බව පරික්ෂාව, ගෘහස්ථ ජල මීටර් පරික්ෂාව සහ තොග ජල සැපයුම් මීටර් පරික්ෂාව යනාදී කාණ්ඩ 03 ක පරික්ෂාවන් ව්‍යාපෘතිය මඟින් ක්‍රියාත්මක කර තිබුණි. කෙසේ වෙතත්, ජාත්‍යන්තර පිළිගැනීම සඳහා ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයෙන් පරීක්ෂණාගාර පරීක්ෂණ සඳහා වූ ISO 17025 ප්‍රතීතන සහතිකය ලබාගැනීමට ව්‍යාපෘතිය විසින් පියවර ගෙන නොතිබුණි.

### 3.3 මූල්‍ය පාලනය පිළිබඳ ගැටළු

මුදල් රෙගුලාසි 133 සහ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2010 ජුලි 26 දිනැති අංක 05 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන ඒකකය මඟින් ව්‍යාපෘතියේ ගණුදෙනු විගණනය කර නොතිබුණි.